සැ. යු.- 2012.12.21 දින පළවූ අංක 1790 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොවීය.
මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2012 වර්ෂය සඳහා ගාල්ල අධිකරණ කලාපයට සහ බලපිටිය අධිකරණ කලාපයට අයත් සාමාන්‍ය ජූරි සභිකයින්ගේ සහ විශේෂ ජූරි සභිකයින්ගේ නාමලේඛනයක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම පළවේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,791 - 2012 දෙසැම්බර් මස 28 වැනි සිකුරාදා - 2012.12.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු - ඇබෑර්තු … … … … | – |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … | 2007 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 ජනවාරි මස 18 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 ජනවාරි මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (*වැ. බ.*)

2012 දෙසැම්බර් මස 14 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.


2005 - B 80676—8,880 (2012/12)
B1-

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය**

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ II පන්තියේ "ආ" ශ්‍රේණියේ පර්යේෂණ සහකාර තනතුරට බඳවා ගැනීම - 2013**

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ II පන්තියේ "ආ" ශ්‍රේණියේ පර්යේෂණ සහකාර තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල් විසින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. *විභාගය* :

2013 පෙබරවාරි මාසයේ දී සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල් විසින් මහනුවර දී මෙම විභාගය පවත්වනු ලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල්ට බලය ඇත.

03. *සේවා කොන්දේසි* :

රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසි වලට ද, මෙහි පහත සඳහන් කොන්දේසිවලට ද, යටත්ව පර්යේෂණ සහකාර සේවයේ II පන්තියේ "ආ" ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

(i) පත්කරනු ලබන නිලධාරියා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ කොන්දේසියට යටත් වේ.

(ii) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

(iii) විවෘත බඳවා ගැනීම් යටතේ පත්කරනු ලබන නිලධාරීන් වසර 3ක පරිවාස කාලයකට යටත් කරනු ලැබේ. රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කරන ලද නිලධාරියෙකු පත් කරනු ලැබුවහොත්, එක් වසරක වැඩ බැලීමේ කාල සීමාවකට යටත් කරනු ලැබේ. විවෘත ධාරාවෙන් බඳවා ගන්නා නිලධාරීන් තනතුරට බඳවා ගෙන වසර 03ක් සම්පූර්ණ කිරීමට පෙර පළමුවැනි කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණයෙන් සමත් විය යුතු ය.

(iv) රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවකට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතාවයක් සේවයට බැඳී වසර 05ක් තුළ ලබාගත යුතු ය.

(v) පත්වීම් ලබන නිලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගවලට ද, කාර්ය පරිපාටික රීති වලට ද, ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන නියමයන් හා රෙගුලාසිවලටත් අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ රෙගුලාසිවලටත් යටත් වේ.

04. වැටුප් පරිමාණය :

MN-3-2006A- පර්යේෂණ සහකාර සේවයේ II "ආ" ශ්‍රේණියේ රු. 15,005 - 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 -රු. 27,885 (රා. පරි. ච. ලේ. 07/2008 අනුව මාසික)

මෙම වැටුප් පරිමාණයේ රු. 15,005 - 4 x 180 - 6 x 240 -රු. 17,165/- වැටුප් පියවරයන් මෙම ශ්‍රේණියට හිමිවේ.

II "ආ" ශ්‍රේණියේ නිලධාරීන් තුන්වැනි වැටුප් වර්ධකය ලැබීමට පෙර පළමුවන කාර්යක්‍ෂමතා කඩඉම සමත් විය යුතු ය.

05. වයස් සීමාව :-
අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවු. 18ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ට උපරිම වයස් සීමාව බල නොපායි.

06. *අධ්‍යාපන, වෘත්තීය හා වෙනත් සුදුසුකම්* :

06.1 අධ්‍යාපන සුදුසුකම් :

(i) අ. පො. ස. (උසස් පෙළ)
රසායන විද්‍යාව, කෘෂිකර්ම විද්‍යාව හා ජීව විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විද්‍යා විෂයයන් 3කින් අ. පො. ස. (උසස් පෙළ) විභාගය එකවරම සමත් වීම.

සහ

(ii) අ. පො. ස. (සාමාන්‍ය පෙළ)

භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථය සහිතව විෂයයන් 06කින් අ. පො. ස. (සා. පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත් වීම.

හෝ

ඒ හා සමාන විභාගයකින් සමත් වීම.

06.2 වෘත්තීය සුදුසුකම් :

ශ්‍රී ලංකා සත්ත්ව පාලන විද්‍යාලයක් විසින් නිකුත් කරන ලද ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම. (ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනය වන විට අදාළ සහතිකය ලබා තිබිය යුතු ය)

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්‍ෂණ සහතික නිකුත් කරන ලද ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව, ඉහත සඳහන් තාක්‍ෂණ සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් තාක්‍ෂණික සුදුසුකම් ලබා තිබීම.

06.3 වෙනත් සුදුසුකම් :

(i) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.

(ii) මනා ශරීර සෞඛ්‍යකින් යුක්ත විය යුතු ය.

අදාළ සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

07. *බඳවා ගැනීමේ ක්‍රමය* :

මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන විවෘත තරග විභාගයට පෙනී සිටිය යුතු ය.

විවෘත තරග විභාගය සඳහා නියමිත සෑම ප්‍රශ්න පත්‍රයකටම 40% ක් හෝ ඊට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයින්, මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දීම සිදු නොකරන අතර, සුදුසුකම් තහවුරු කළ අයදුම්කරුවන් විභාගයේ දී ලබාගත් මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

08. *විභාගය* :

(i) මෙම විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

(ii) අපේක්ෂකයින් කැමති භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක.

(iii) ඉල්ලීම් කරන ලද භාෂා මාධ්‍ය විභාගයේ දී වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

(iv) විභාග ගාස්තුව රු. 400.
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමට නිකුත් කරන ලද පේරාදෙණිය, තැපැල් කාර්යාලයෙන් මුදල් කර ගත හැකි වනසේ ලබාගත් මුදල් ඇනවුමක් ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතු ය.

(v) විභාග විෂයයන් : විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

1. බුද්ධි පරීක්ෂණය
2. තාක්ෂණික ප්‍රශ්න පත්‍රය

(vi) විෂය නිර්දේශය :

(*අ*) බුද්ධි පරීක්ෂණය : කාලය පැය 1යි මුළු ලකුණු 100යි
අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයන් ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයන් තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්තය.

(*ආ*) තාක්ෂණ ප්‍රශ්න පත්‍රය : කාලය පැය 1යි මුළු ලකුණු 100 යි.

පහත දැක්වෙන විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

(i) රසායනාගාර උපකරණ හඳුනාගැනීම හා නඩත්තුව

(ii) රෝග විනිශ්චය සඳහා යොදා ගන්නා පරීක්ෂණ ක්‍රම-
ව්‍යාධි වේද
පරපෝෂිත වේද
ක්ෂුද්‍ර ජීව වේද
මස්තු වේද
පෝෂණ

(iii) තත්ත්ව පාලනය සඳහා යොදා ගන්නා පරීක්ෂණ ක්‍රම-
භෞතික පරීක්ෂණ
*රසායනික පරීක්ෂණ*
*සංවේදතා පරීක්ෂණ*

(iv) රසායනාගාර පවිත්‍රතාව, විෂබීජහරණය

(v) සාම්පල් ලබාගැනීම, ගබඩා කිරීම, ප්‍රවාහනය

09. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :

(i) ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනය සමග ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු ය. 8 1/2 x 12 (A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සකස් කර ගත් ඉල්ලුම්පත්‍රය 2013.01.25 දිනට පෙර අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "පර්යේෂණ සහකාර" තනතුරට බඳවා ගැනීමේ තරග විභාගය යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සටහන* :-
රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් ස්වකීය ඉල්ලුම්පත්‍රය තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ.

(ii) සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී ඉල්ලුම්පත්‍ර නැතිවීම හෝ ප්‍රමාදවීම සම්බන්ධව කෙරෙන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(iii) ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. විභාගය පැවැත්වෙන දිනය පුවත්පත් දැන්වීමක් මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ. ඉල්ලුම්කරුවන්ට විභාග ප්‍රවේශපත්‍රය විභාගය පැවැත්වෙන දිනයට දින හතරකට කලින් නොලැබුනහොත් පහත සඳහන් විස්තර ඇතිව වහාම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට දැන්විය යුතු ය.

i. අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :—————.
ii. ලිපිනය :—————.
iii. ඉල්ලුම්පත් තැපැල් කිරීමේ දිනය, ලියාපදිංචි අංකය, තැපැල් කාර්යාලය :—————.

10. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අයදුම්පත්‍රයට අමුණා එවිය යුතු ය.

i. *උප්පැන්න සහතිකය*,
ii. අධ්‍යාපන සුදුසුකම් තහවුරු කිරීමේ සහතික,
iii. සත්ත්ව පාලන ඩිප්ලෝමා සහතිකය.

*අපේක්ෂකයාගේ අනන්‍යතාවය* :-

විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙක්ම විභාග ශාලාවේ දී තමාගේ අනන්‍යතාව විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් ඔප්පුකර සිටිය යුතු ය. ඒ සඳහා පහත ලේඛන පිළිගැනේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් නිකුත් කරන ලද හැඳුනුම් පත්‍රය,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය (විභාග දිනට අවුරුදු 3කට කලින් නිකුත් කරන ලද)

*සාවද්‍ය තොරතුරු සැපයීම* :

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා යම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක හෝ ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට හැකි වන්නේය. අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන දැන

ඉදිරිපත් කළ බව පෙනී ගියහොත් ඔහු සේවයෙන් පහ කිරීමට යටත් වන්නේය.

මෙම ගැසට් පත්‍රයේ 03 ඡේදයේ ප්‍රකාශිත රාජ්‍ය සේවයට පත්කිරීමට අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි හා විභාග අපේක්ෂකයින් සඳහා නීති හා උපදෙස් කෙරෙහි අවධානය යොමු කර ඒවා පිළිපැදිය යුතු ය.

11. මෙම ගැසට් නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් ගැන ගැටළුවක් මතු වුවහොත් ඒ සම්බන්ධයෙන් ද විභාගය මගින් බඳවා ගත යුතු අපේක්‍ෂක සංඛ්‍යාව සම්බන්ධයෙන් ද තීරණයක් ගැනීමේ බලය සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල් සතුවේ. එය අවසන් තීරණය වේ.

වෛද්‍ය ඩබ්. කේ. ද සිල්වා,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය
අධ්‍යක්‍ෂ ජනරාල්.

2012 නොවැම්බර් මස 28 වැනි දින,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

***පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය***

*සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව*

**ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ II පන්තියේ "ආ" ශ්‍රේණියේ පර්යේෂණ සහකාර නිලධාරී තනතුර සඳහා අයදුම්පත**

| විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය | |
|---|---|

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

(අදාළ කොටුව තුළ ලියන්න)

01. නම :

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————. (උදා : SILVA B. A.)

1.2 සම්පූර්ණ නම සිංහලෙන් :————.

1.3 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

02. ලිපිනය :
පෞද්ගලික :————.
රාජකාරී ලිපිනය :————.
ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය: ————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය : (අදාළ කොටුව තුළ සළකුණු කරන්න.)

3.1 ස්ත්‍රී
පුරුෂ

3.2 උපන් දිනය :

වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

3.3 ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසන් දිනට වයස :

අවුරුදු | | | | | මාස | | | දින | | |

3.4 විවාහක/අවිවාහක බව (අදාළ අංකය කොටුව තුළ සළකුණු කරන්න.)
විවාහක
අවිවාහක

04. අධ්‍යාපන සුදුසුකම් :

4.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය :
වර්ෂය :————. මාසය :————.

| *විෂයය* | *ලබාගත් සාමාර්ථය* | *විභාග අංකය* |
|---|---|---|
| | | |

4.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය

වර්ෂය :————. මාසය :————.

| *විෂයය* | *ලබාගත් සාමාර්ථය* | *විභාග අංකය* |
|---|---|---|
| | | |

4.3 සත්ත්ව පාලන ඩිප්ලෝමාව ලබාගත් ආයතනය :————.

4.4 සත්ත්ව පාලන ඩිප්ලෝමාව ලබාගත් වර්ෂය :————.

05. වර්තමාන රැකියාව හා කලින් දැරූ පත්වීම් : (ඇත්නම් පමණක්)

| *තනතුර* | *ආයතනය* | *සිට* | *දක්වා* |
|---|---|---|---|
| | | | |

06. විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලයේ නම :————.
මුදල් ඇණවුම් අංකය :————.

සම්පූර්ණ විභාග ගාස්තුව රු. 400 කි. දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකින් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල් නමට ගෙවන කාර්යාලය :- පේරාදෙණිය.
කුවිතාන්සිය මෙහි අලවන්න.

07. මෙම ඉල්ලුම්පත්‍රයේ ම විසින් සපයන ලද තොරතුරු සත්‍ය වුත්, නිවැරදිවුත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර

අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවටත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත්වන බවත් මම දනිමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

දැනට රජයේ ස්ථිර සේවයේ නියුක්ත නිලධාරීන්ට පමණක් අදාළ වේ.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

මෙම දෙපාර්තමේන්තුවේ ................................... ලෙස සේවය කරන ................. මයා/මිය/මෙනවිය විසින් සපයා ඇති විස්තර පරීක්‍ෂා කර බැලූ බවත් ඒවා නිවැරදි බවත් අපේක්‍ෂකයා/අපේක්‍ෂිකාව ඉහත තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් සහතික කරමි.

————————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා,
(නිල මුද්‍රාව තැබිය යුතුය)

පදවි නාමය :—————.
ලිපිනය :—————.
දිනය :—————.

12-661

---

**ක්‍රීඩා අමාත්‍යාංශය**

ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය

**ක්‍රීඩා විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව - 2013/2014**

ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය මගින් සිංහල භාෂාවෙන් පවත්වනු ලබන ක්‍රීඩා විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා වයස අවුරුදු 18-35 (රජයේ සේවයේ නියුක්තව සිටින්නන්ට වයස් සීමාව 45 ට නොවැඩි විය යුතුය) අතර සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :

*1. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

1.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) පරීක්ෂණයේ දී සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය/ අංක ගණිතය ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06 කින් සම්මාන 03 ක් සහිතව සමත් විය යුතු ය.

1.2 තව ද, ඔහු හෝ ඇය,

(අ) ක්‍රීඩා අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලේ පළමු, දෙවන හෝ තෙවන ස්ථාන ලබා තිබීම හෝ එම උළෙලේ දිස්ත්‍රික්ක මට්ටමේ තරගයක දී කේවල ඉසව්වක ප්‍රථම හෝ දෙවන ස්ථානය ලබා තිබීම හෝ කණ්ඩායම් තරගයක ප්‍රථම ස්ථානය ලබා තිබීම;

හෝ

(ආ) ජාතික ක්‍රීඩා සංගමයකින් පවත්වනු ලබන ජාතික මට්ටමේ තරගයක දී කේවල ඉසව්වක ප්‍රථම, දෙවන හෝ තෙවන ස්ථානය ලබා තිබීම හෝ කණ්ඩායම් තරගයක ප්‍රථම හෝ දෙවන ස්ථාන ලබා තිබීම ;

හෝ

(ඇ) ජාතික පාසැල් ක්‍රීඩා තරගාවලියේ වයස 16 න් ඉහළ කේවල තරගයක ප්‍රථම ස්ථානය දිනා තිබීම හෝ කණ්ඩායම් තරගයක ශූරතාවය දිනා තිබීම ;

හෝ

(ඈ) ජාතික ක්‍රීඩා කණ්ඩායමක සාමාජිකයෙකු වශයෙන් දකුණු ආසියාතික තරග, ආසියාතික ශූරතා තරග, ආසියාතික තරග, පොදු රාජ්‍ය මණ්ඩලීය, ලෝක කුසලාන, හෝ ඔලිම්පික් තරගයකට සහභාගී වී තිබීම,

හෝ

(ඉ) ක්‍රීඩා අමාත්‍යාංශයේ හෝ ඒ යටතේ ඇති ආයතනයක හෝ පළාත් සභාවක ක්‍රීඩා නිලධාරියෙකු හෝ නිලධාරිණියක වශයෙන් සේවය කිරීම, හෝ අධ්‍යාපන අමාත්‍යාංශයේ ක්‍රීඩා ගුරුවරයෙකු හෝ ගුරුවරියක වශයෙන් සේවය කිරීම, (සටහන 01 ට අදාළ අවශ්‍යතාවයන් සපුරා තිබීම අනිවාර්ය වේ.) ;

හෝ

(ඊ) රජයේ පිළිගත් ආයතනයක ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ ගුරුවරයෙකු, ගුරුවරියක, පුහුණුකරුවෙකු හෝ පුහුණුකාරිණියක (ස්වේච්ඡා වුව ද විය හැක) වීම, තරුණ සේවා සභාවේ ක්‍රීඩා නිලධාරියෙකු නිලධාරිණියක වශයෙන් වසර 05 ක සේවා පළපුරුද්දක් සහිතව ජාතික ක්‍රීඩා සංගමයකින් ලබාගත් ක්‍රීඩා පුහුණු කිරීමේ අදියර බලපත්‍රයක් ලබා තිබීම ;

හෝ

(උ) ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ හෝ සිවිල් ආරක්ෂක අංශයේ පුහුණු කිරීමේ ආයතනයක, පාසැලක ක්‍රීඩා හෝ ශාරීරික පුහුණු උපදේශකවරයෙකු/වරියක වශයෙන් මාස 06 කට නොඅඩු මූලික සහ උසස් පාඨමාලාවක් සාර්ථකව හදාරා තිබීම.

*සැ. යු. සටහන :*

01. ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ සේවයේ නියුතු වුවන් වසර 01 ක සේවා කාලයක් හා අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සේවයේ නියුතු වුවන් වසර 05 ක (විද්‍යාපීඨ අභ්‍යාසලාභී ශාරීරික අධ්‍යාපන ගුරුවරුන් සඳහා පමණක් වසර 02 ක) සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

02. නියමිත ආකෘතිය ප්‍රකාරව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවේ.

*2. අයදුම්පත් එවීමේ ක්‍රමය :*

2.1 ඉහත සඳහන් අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් හෝ අපේක්ෂිකාවන් විසින් මෙම නිවේදනය

අවසානයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය පරිදි 8 " x 13 1/2 " ප්‍රමාණයේ කඩදාසියක සකස් කර ගත් අයදුම්පත් තම අත් අකුරින් සම්පූර්ණ කර 2013.01.30 වැනි දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ, ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය, අංක 100/7, නිදහස් මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

2.2 අයදුම්පත බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ "2013/2014 ක්‍රීඩා විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කර එවිය යුතු ය.

2.3 රජයේ, පළාත් පාලන සේවයේ, සංස්ථා සේවයේ නියුතු නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්, අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතු ය. එසේ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2.4 විභාග ගාස්තු වශයෙන් රු. 500 ක මුදල් ඇණවුමක් ලේකම්, ක්‍රීඩා අමාත්‍යාංශය නමට කුරුඳුවත්ත තැපැල් කාර්යාලයෙන් මාරු කරගත හැකි වන පරිදි එවිය යුතු අතර, කුවිතාන්සිය අයදුම්පත සමග එවිය යුතු ය.

3. *තෝරා ගැනීම :*

මෙම පාඨමාලාව සඳහා ලැබෙන අයදුම්පත් අතුරින් සුදුසුකම් සම්පූර්ණ කර ඇති සියලු දෙනා ලිඛිත පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, බඳවා ගැනීමේ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ලකුණු ලබාගත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට හා ශාරීරික යෝග්‍යතා ප්‍රායෝගික පරීක්ෂණයකට කැඳවීමෙන් පසුව පාඨමාලාව සඳහා තෝරාගනු ලැබේ.

4. *පාඨමාලාව පිළිබඳ විස්තර :*

4.1 විෂය නිර්දේශය පහත සඳහන් පරිදි කොටස් 05 කින් යුක්තය.

(අ) පුහුණුවීමේ සාමාන්‍ය සිද්ධාන්ත (ශාරීරික ගුණාංග හා හැකියාවන්, තාක්ෂණ ක්‍රම, උපාය මාර්ග, පුහුණුවීම් ක්‍රම, සැලසුම් ක්‍රම, භාරය හා පරීක්ෂණ පිළිබඳ මූලධර්ම ආදී වශයෙනි) සහ වාචික පරීක්ෂණය.,

(ආ) අවම වශයෙන් ක්‍රීඩා 10 ක් පිළිබඳ න්‍යායික හා ප්‍රායෝගික දැනුම,

(ඇ) ජවන හා පිටිය මලල ක්‍රීඩා පිළිබඳ විශේෂඥතාවය,

(ඈ) ජවන හා පිටිය මලල ක්‍රීඩාවලට අමතරව ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලා කාලය තුළ කාන්තා හෝ පිරිමි අය සඳහා අවස්ථානෝචිත පරිදි තෝරා ගන්නා ලද එක් ක්‍රීඩාවක් පිළිබඳ විශේෂඥතාවය. (පාපන්දු/වොලිබෝල්/නෙට්බෝල්)

(ඉ) ක්‍රීඩා කායික විද්‍යාව, සමාජ විද්‍යාව, ක්‍රීඩා පරිපාලනය, ක්‍රීඩා සංඛ්‍යානය, ක්‍රීඩා උත්සව සංවිධාන ක්‍රම, ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව, ක්‍රීඩා ජීව රසායන විද්‍යාව, ක්‍රීඩා පෝෂණය සහ ක්‍රීඩා මනෝ විද්‍යාව වැනි පොදු විෂයයන් අධ්‍යයනය කිරීම.

4.2 පාඨමාලාවේ කාලසීමාව මාස 12 කි.

4.3 මෙම පාඨමාලාව සඳහා තෝරාගනු ලබන, අයදුම්කරුවන් විසින් රු. 30,000 ක මුදලක් ගාස්තු වශයෙන් ගෙවිය යුතු ය. එමෙන්ම මෙම මුදල චෙක්පතකින් ගෙවන්නේ නම් ලේකම්, ක්‍රීඩා අමාත්‍යාංශය යනුවෙන් සටහන් කළ යුතු ය. මෙම මුදල කුමන හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ.

4.4 පාඨමාලාව හැදෑරීම සඳහා තෝරාගනු ලබන අය, ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ නීති හා රෙගුලාසි පිළිපැදීමට බැඳී සිටිය යුතු ය.

4.5 පාඨමාලාව සාර්ථකව නිම කරන අය සඳහා ක්‍රීඩා විද්‍යා ඩිප්ලෝමා සහතික පත්‍රය ප්‍රදානය කරනු ලැබේ.

5. *අනෙකුත් කොන්දේසි :*

5.1 පාඨමාලාව අවසානයේ දී රැකියාවක් ලබාදීමට මෙම අමාත්‍යාංශය බැඳී නැත.

5.2 එසේකුදු වුවත්, පාඨමාලාව හදාරන්නන් විසින් ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ සමග ගිවිසුමකට එළඹිය යුතු යැයි මෙම අමාත්‍යාංශය අදහස් කරන්නේ නම්, එම ගිවිසුමට එළඹීමට පාඨමාලාව හදාරන්නන් බැඳී සිටිය යුතු ය.

5.3 පවතින ඉහළම සුදුසුකම් හෝ ඉල්ලා ඇති සුදුසුකම් අයදුම් පතෙහි සඳහන් කළ යුතු අතර සඳහන් නොකරන ලද දත්ත පසුව ඉදිරිපත් කළ ද බාරගනු නොලැබේ.

5.4 මෙහි ආවරණය නොවන අනිකුත් කරුණක් වේ නම්, ඒ සම්බන්ධයෙන් ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ, සිය අභිමතය පරිදි කටයුතු කරනු ඇත.

අධ්‍යක්ෂ,
ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය,
අංක 100/7, නිදහස් මාවත,
කොළඹ 07.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**ක්‍රීඩා විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව - 2013/2014 වර්ෂය**

ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය

01. (i) සම්පූර්ණ නම :————. මයා/මිය/මෙනවිය
(ii) මුලකුරු සමග නම :————.
(iii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | |

(iv) ජාතික හැඳුනුම්පත් අංකය :————.

02. ලිපිනය : (i) පෞද්ගලික :————.
(ii) කාර්යාලීය :————.

දුරකථන අංක : පෞද්ගලික :————. රාජකාරී :————.

03. (i) උපන් දිනය :

වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

(ii) 2012.12.31 වැනි දිනට වයස :

වර්ෂ | | | මාස | | | දින | | |

04. ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? නැති ද? යන වග :—————.
පුරවැසියෙක් නම්, ලියාපදිංචි වීමෙන් ද? පරම්පරාවෙන් ද? යන වග :—————.

05. (i) ස්ත්‍රී/පුරුෂ භාවය :—————.
(ii) විවාහක/අවිවාහක බව :—————.

06. ඔබ රැකියාවක් කරයි ද?/නොකරයි ද? යන වග :—————.
(i) සේවා ස්ථානය :—————.
(ii) දැනට දරන තනතුර :—————.
(iii) රැකියාවේ සේවා කාලය :—————.

07. ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් ඃ

| *වර්ෂය* | *විභාගය* | *විෂයයන්* | *ලබා ඇති සාමාර්ථයන්* |
|---|---|---|---|
| | | | |

08. ක්‍රීඩා දක්ෂතාවයන් (ලබා ඇති ඉහළම ක්‍රීඩා සහතික හා විශේෂ දස්කම් පිළිබඳ මෙහි සටහන් කරන්න) :—————.

09. (i) ගැසට් නිවේදනය අනුව ඔබ මෙම පාඨමාලාවට සුදුසුකම් ලබන්නේ ඉහත 1.2 ඡේදයේ අ, ආ, ඇ, ඈ, ඉ, ඊ, උ, දක්වා වන ඡේදවලින් කුමන ඡේදය යටතේ ද? :—————.

(ii) අදාළ ඡේදය යටතේ ඔබ ලබා ඇති ක්‍රීඩා සුදුසුකම් විස්තර සහිතව සඳහන් කරන්න. :—————.

10. වෙනත් කරුණු :—————.

11. කුරුඳු වත්ත තැපැල් කාර්යාලය වෙත එවන ලද විභාග ගාස්තු කුවිතාන්සි අංකය :—————.
(ලේකම්, ක්‍රීඩා අමාත්‍යාංශය නමට එවිය යුතු අතර, කුවිතාන්සිය මෙයට අමුණා එවිය යුතුය.)

12. මෙම පාඨමාලාවට තෝරාගනු ලැබුවහොත්, රු. 30,000 ක මුදලක්, පාඨමාලා ගාස්තු වශයෙන් ගෙවීමට ඔබ සූදානම් ද, යන වග :—————.

මෙහි ඉහත මා විසින් දක්වා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මම සහතික කරමි. මෙම තොරතුරු අසත්‍ය හෝ වැරදි හෝ බව යම්කිසි අයුරකින් සොයාගනු ලැබුවහොත් මෙම පාඨමාලාව හැදෑරීමට නුසුදුස්සකු වන බව හා පුහුණු පාඨමාලාවෙන් ඉවත් කරනු ලබන බව මම දනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

**රජයේ පළාත් පාලන සේවයේ හා සංස්ථා සේවයේ නියුක්ත වූවන් සඳහා පමණි**

අධ්‍යක්ෂ,
ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය.

මෙම............... සේවය කරන .............................. වන ........................ මහතා/මහත්මිය/මෙනෙවියගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරන අතර, මෙම අයදුම්කරු ඉහත පාඨමාලාව සඳහා තෝරාගනු ලැබුවහොත් පාඨමාලා කාලය සඳහා ඔහුව/ඇයව සේවයෙන් නිදහස් කළ හැකි බවට සහතික කරමි.

—————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

නිල මුද්‍රාව :—————.
දිනය :—————.

නම :—————.
තනතුර :—————.

12-767

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.